ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2024.08-26 |
|---|---|---|---|

**පැමිණිලිකාර පාර්ශවය** : 1. ජී.ඩී.කේ. විතාන
72/03/42, මිඩ්ලෑන්ඩ් සිටි,
උඩුපිල, දෙල්ගොඩ.

2. ඊ.එච්.සී.එස්. ජයසූරිය
නො.133/12, ශාන්ති මාවත,
හිඹුටාන, අංගොඩ.

3. ඩබ්. එස්. හල්ලලුව
148/2F, පැලැන්වත්ත,
පන්නිපිටිය

**වගඋත්තරකාර පාර්ශවය** : විදුහල්පතිනිය,
සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය,
කොළඹ 07.

**<u>පැමිණිලි අංක : HRC/HO/2573/23</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

ඉහත 1 වන, 2 වන සහ 3 වන පැමිණිලිකාරියන් තිදෙනා විසින් ප්‍රකාශ කර සිටින්නේ ඔවුන් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරනු ලබන නිලධාරිනියන් වන බවයි. එසේම, පැමිණිලිකාරියන් තිදෙනා විසින් ප්‍රකාශ කර සිටින්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයේ නියුතු වසර තුන (03)ක සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන්හට තම දරුවන් ජාතික පාසල් වල අතරමැදි ශ්‍රේණි සඳහා ඇතුළත් කිරීමට අදාළව අභ්‍යන්තර චක්‍රලේඛයක් පවතින බවත්, ඒ සඳහා අයදුම් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ වසර තුන (03)ක සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන්හට අවස්ථාව ලැබෙන බවත්, එලෙස අයදුම් කරනු ලබන නිලධාරීන් අතරින් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය මත පත් කරනු ලබන අධ්‍යාපන කමිටුවක් මගින් තෝරා



| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrc@gmail.com |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

පත් කරගනු ලබන බවත් ය. ඒ අනුව අයදුම්පත් කැඳවූ අවස්ථාවේදී පැමිණිලිකාරියන් තිදෙනා විසින් ද ඒ සඳහා අයදුම් කළ බවත්, එහිදී අදාළ කමිටුව විසින් ඔවුන්ගේ දියණියන් තිදෙනා කොළඹ 07, සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ 4වන ශ්‍රේණිය සඳහා ඇතුළත් කිරීමට අනුමැතිය ලබාදුන් බවත් පැමිණිලිකාරියන් තිදෙනා විසින් සිය පැමිණිල්ල තුළින් දක්වා ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අංක ED/08/01/01/01/ST/Vol –II සහ 2022.12.02 දිනැතිව පැමිණිලිකාරියන් තිදෙනා වෙත ලිපි ත්‍රිත්වයක් නිකුත් කර ඇති බව පැමිණිල්ල තුළින් දක්වා ඇත. එකී ලිපි ප්‍රකාරව 1 වන පැමිණිලිකාරිය වන ජී.ඩී.කේ. විතාන යන අයගේ දියණිය වන යූ.එන්.ඒ.එම්. ජයරත්න, 2 වන පැමිණිලිකාරිය වන ඊ.එච්.සී.එස්. ජයසූරිය යන අයගේ දියණිය වන දිනාගි දියත්මා වල්පිටගමගේ සහ 3 වන පැමිණිලිකාරිය වන ඩබ්.එස්. හල්ලලුව යන අයගේ දියණිය වන තෙසාරා සේමින්දි වික්‍රම විතාරණ යන දියණියන් තිදෙනා කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ 4 වන ශ්‍රේණිය වෙත ඇතුළත් කර ගන්නා ලෙසට එකී විද්‍යාලයේ විදුහල්පති වෙත දැනුම්දී තිබූ බවත් පැමිණිලිකාරියන් තිදෙනා විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, පැමිණිලිකාරියන් තිදෙනා විසින් ප්‍රකාශ කර සිටින්නේ, ඔවුන් ඉහත කී ලිපි ත්‍රිත්වයේ මුල් පිටපත් කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත භාරදෙනු ලැබූ නමුත්, ඔවුන් හට විද්‍යාලයෙන් කිසිඳු කැඳවීමක් නොලැබුණු බවත්, එලෙස කැඳවීමක් නොලද හෙයින් වරින්වර විද්‍යාලයට ගොස් අදාළ ලිපි පිළිබඳව විමසීම් සිදු කළ බවත් ය. එලෙස විමසූ එක් අවස්ථාවකදී එනම්, 2023.03.17 වන දින විදුහල්පතිනිය විසින් පැමිණිලිකාරියන් තිදෙනා අධ්‍යාපන අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් වන බැවින් ඔවුන් හට ප්‍රමුඛතාවය දක්වන ලෙසට දන්වා අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ලිපියක් නිකුත් කරන්නේ නම් පැමිණිලිකාරියන් තිදෙනාගේ දියණියන් ඇතුළත් කරගත හැකි බව දැනුම් දුන් බවත් පැමිණිලිකාරියන් තිදෙනා විසින් සඳහන් කර ඇත.

ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් පරිදි අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් නිකුත් කරන ලද අංක ED/09/Ads/(SA)/07 සහ 2023.03.21 දිනැති ලිපිය සහ සමාංක සහ 2023.03.24 දිනැති ලිපිය ප්‍රකාරව පැමිණිලිකාරියන් තිදෙනාගේ දියණියන් තිදෙනා කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ 4 වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති ලිපි සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලෙස විදුහල්පතිනිය වෙත දැනුම්දී තිබූ බවත්, එකී ලිපි ද්විත්වයම විද්‍යාලය වෙත භාරදුන් බවත් පැමිණිලිකාරියන් තිදෙනා විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකාරියන් තිදෙනා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, ඉහත කී 2023.03.24 දිනැති ලිපිය විද්‍යාලය වෙත භාරදීමෙන් අනතුරුව වරින්වර විද්‍යාලය වෙත ගොස් විමසා සිටියද ඔවුන්හට විද්‍යාලය තුළට යාමට අවසර නොලැබුණු බවයි. පසුව 2023.03.30 වන දින විදුහල්පතිනිය විසින් එම දිනය වන විට මෙම දියණියන් තිදෙනා 5 වන ශ්‍රේණියට සමත්ව ඇති බැවින් අලුත් වාරය සඳහා දරුවන් ඇතුළත් කිරීම කළ නොහැකි බවත්, විද්‍යාලයේ එක් පන්තියක සිටිය යුතු දරුවන් ප්‍රමාණය ඉක්මවා ඇති බැවින්

මෙම දියණියන් තිදෙනා විද්‍යාලයට ඇතුළත් කර ගත නොහැකි බවත් දැනුම් දුන් බව පැමිණිලිකාරියන් තිදෙනා විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකාරියන් තිදෙනා විසින් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරීන්ගේ දරුවන් පාසල් වල අතරමැදි ශ්‍රේණි සඳහා ඇතුළත් කිරීම සඳහා එකම දිනයේදී එකම අංකයෙන් නිකුත් කරන ලද ලිපි අතරින් කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ 2 වන ශ්‍රේණියට ඇතුළත් කිරීමට ලිපි ලබාදුන් නිලධාරීන්ගේ දියණියන් විද්‍යාලය වෙත ඇතුළත් කරගෙන ඇති නමුත් පැමිණිලිකාරියන් තිදෙනාගේ දියණියන් ඇතුළත් කර ගැනීමට එකී ලිපි ප්‍රමාණවත් නොමැති බවට දන්වා තවත් ලිපි රැගෙන එන ලෙස පැවසූ බවයි. එලෙස ලිපි ලබාදුන්න ද සිය දියණියන් තිදෙනා පාසල වෙත ඇතුළත් කර නොගත් නමුත්, ඔවුන්ට පසුව එම විද්‍යාලය සඳහා අයදුම් කළ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකුගේ දියණියක 2022 අධ්‍යයන වර්ෂයේදී 4 ශ්‍රේණිය සඳහා ඇතුළත් කර ඇති බවත් පැමිණිලිකාරියන් තිදෙනා විසින් ප්‍රකාශ කර ඇත. මෙලෙස පැමිණිලිකාරියන් තිදෙනා හට වෙනස් කොට සැළකීම තුළින් ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට ප්‍රකාශ කර ඇත.

එසේ හෙයින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති ලිපි වලට අනුව සිය දියණියන් තිදෙනා කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය වෙත ඇතුළත් කර දෙන ලෙසට පැමිණිලිකාරියන් තිදෙනා විසින් සිය පැමිණිල්ල තුළින් ඉල්ලා සිටිනු ලබයි.

මෙම පැමිණිල්ලට අදාළව පැමිණිලිකාරියන් තිදෙනාගේ සහ වගඋත්තරකාර පාර්ශවය නියෝජනය කරමින් කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිනියගේ සහ සහකාර විදුහල්පතිනියකගේ සහභාගීත්වයෙන් 2024.03.15 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පරීක්ෂණයක් පවත්වා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

වගඋත්තරකාර පාර්ශවය වන කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් 2023.12.04 දිනැතිව වාර්තාවක් යොමු කරමින් ප්‍රකාශ කර ඇත්තේ 2022 වර්ෂයේ මුල සිටම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අතරමැදි ශ්‍රේණි සඳහා සිසුවියන් ඇතුළත් කිරීම සඳහා ලිපි යොමු කළ බවත්, ඒ අනුව සිසුවියන් ඇතුළත් කර ගන්නා ලද බවත් ය. එසේ හෙයින් වර්ෂය අවසාන වනවිට පන්ති කාමර වල පුරප්පාඩු මෙන්ම ඉඩ පහසුකම් නොමැති වීම නිසා මෙම පැමිණිලිකාර නිලධාරීන්ගේ දියණියන් තිදෙනා 4 වන ශ්‍රේණියට ඇතුළත් කිරීමට අසීරු වූ බවත් එකී වාර්තාව තුළින් දක්වා ඇත.

තවද, වගඋත්තරකාර පාර්ශවය වන කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් 2024.04.01 දිනැති වාර්තාව යොමු කරමින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකාරියන් තිදෙනාගේ ලිපි වලට අමතරව විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකුගේ ලිපිය ද ලැබී තිබූ බවයි. එකී කථිකාචාර්යවරයාගේ දියණිය සහෝදර පදනම මත පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වුවත් ලබාගත් ලකුණු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම විද්‍යාලයට

ඇතුළත් කර ගැනීමට නොහැකි වූ බවත්, එකී කථිකාචාර්යවරයාගේ වැඩිමහල් දියණියද කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයට ඇතුළු වී අධ්‍යාපනය ලබන බැවින් ඒ බව සඳහන් කරමින් අඛණ්ඩව අභියාචනා ඉදිරිපත් කරමින් කරන ලද ඉල්ලීම් අනුව ඒ පිළිබඳව සළකා බැලීමට සිදුවූ බවත්, එබැවින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් යොමු කළ ලිපියට අනුව කථිකාචාර්යවරයාගේ දියණිය විද්‍යාලයට ඇතුළත් කරගත් බවත් එකී වාර්තාව තුළින් වගඋත්තරකාර පාර්ශය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>නිරීක්ෂණ</u>

1 වන, 2 වන සහ 3 වන පැමිණිලිකරියන් තිදෙනා අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරිණියන් තිදෙනෙකු බවත්, 1 වන, 2 වන සහ 3 වන පැමිණිලිකරියන් තිදෙනාගේ දියණියන් වන පිළිවෙලින් යූ.එන්.ඒ.එම්. ජයරත්න, දිනාගි දියත්මා වල්පිටගමගේ සහ තෙසාරා සේමින්දි වික්‍රම විතාරණ යන තිදෙනා කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ 4 වන ශ්‍රේණියට ඇතුළත් කිරීම අනුමත කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ED/08/01/01/01 ST/Vol-II සහ 2022.12.02 දිනැති ලිපි ත්‍රිත්වයක් නිකුත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

එකී ලිපි තුළ ඒවායේ පිටපතක් බැගින් අධ්‍යාපන ලේකම් කාර්යාලයේ ෆැක්ස් අංකයට (0112785162) යොමු කර නිවැරදිභාවය තහවුරු කරගැනීමෙන් අනතුරුව පාසලට ඇතුළත් කර වාර්තා කරන මෙන් කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පති වෙත දන්වා ඇත. එහෙත් විදුහල්පතිනිය විසින් එසේ නිවැරදිභාවය පරික්ෂා කිරීමකින් තොරව පැමිණිලිකාරියන් තිදෙනා හට ඔවුන් අධ්‍යාපන අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් වන බැවින් ඔවුන් හට ප්‍රමුඛතාවය දක්වන ලෙසට දන්වා වෙනත් ලිපියක් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙතින් රැගෙන එන ලෙසට දන්වා ඇති බව පෙනී යයි. ඒ අනුව අංක ED/09/Ads/(SA)/07 සහ 2023.03.21 දිනැති සහ ඉහත සමාංක සහ 2023.03.24 දිනැති ලිපි ද්විත්වය අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් නිකුත් කර ඇති බවත්, පැමිණිලිකාරියන් විසින් එකී ලිපි විද්‍යාලය වෙත යොමු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

එසේ වුවද වගඋත්තරකාර පාර්ශවය වන කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් ඉහත කී ලිපි ලැබී තිබුණ ද, පැමිණිලිකාරියන් තිදෙනාගේ දියණියන් තිදෙනා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට කටයුතු කර නොමැති බව කොමිෂන් සභාවට පෙනී යයි.

පැමිණිලිකාරියන් තිදෙනා විසින් දක්වා ඇත්තේ 4 ශ්‍රේණියට අදාළ අධ්‍යයන වර්ෂය අවසන් වන තුරුම කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් ඔවුන්ගේ ලිපි සම්බන්ධයෙන් නිසි ප්‍රතිචාරයක් නොදක්වා අදාළ අධ්‍යයන වර්ෂය අවසන්ව දියණියන් 5 වන ශ්‍රේණියට සමත් වූ පසුව අලුත් වාරය සඳහා ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීමට ඉඩ පහසුකම් නොමැති බවට දැන්වූ බවයි. එසේම

විදුහල්පතිනිය විසින් සිතාමතාම ඔවුන්හට වෙනත් ලිපි රැගෙන එන ලෙසට දන්වමින් කාලය ගත කළ බව පැමිණිලිකාරියන් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකාර පාර්ශවය වන කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් යොමු කර ඇති 2023.12.04 සහ 2024.04.01 දිනැති වාර්තාවන් ප්‍රකාරව 2022 වර්ෂයේ මුල සිටම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් යොමු කළ ලිපි වලට අදාළව අතරමැදි ශ්‍රේණි සඳහා සිසුවියන් ඇතුළත් කිරීම හේතුවෙන් වර්ෂය අවසාන වනවිට පන්ති කාමර වල පුරප්පාඩු මෙන්ම ඉඩ පහසුකම් නොමැතිවීම නිසා මෙම පැමිණිලිකාර නිලධාරිණියන්ගේ දියණියන් තිදෙනා 4 වන ශ්‍රේණියට ඇතුළත් කිරීම අසීරු වූ බව දන්වා ඇති බව නිරීක්ෂණය වේ.

එලෙස වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටින ආකාරයේ ඉඩ පහසුකම් ඌනතාවයක් පැවතියේ නම් ඒ බව පැමිණිලිකාරියන් විසින් 2022.12.02 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කර තිබූ ලිපි භාරදුන් අවස්ථාවේදී පැමිණිලිකාර පාර්ශවය වෙත නොදන්වා එම නිලධාරිණියන් තිදෙනා හට ප්‍රමුඛතාවය දෙන ලෙසට දන්වා තවත් ලිපියක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ගෙන එන ලෙසට දැනුම් දීම යුක්ති සහගත නොවන බව කොමිෂන් සභාවට පෙනී යයි.

තවද, වඋත්තරකාර පාර්ශවය වන කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති 2024.04.01 දිනැති වාර්තාව ප්‍රකාරව පැමිණිලිකාරියන් තිදෙනාට අමතරව කථිකාචාර්යවරයෙකුගේ දියණියක විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට දන්වා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් යොමු කළ ලිපිය අනුව එම දියණියව පාසලේ 4 වන ශ්‍රේණියට ඇතුළත් කරගත් බවට දක්වා ඇති බව කොමිෂන් සභාවේ අවධානයට යොමු වේ.

පැමිණිලිකාරියන් තිදෙනාගේ දියණියන් තිදෙනා විද්‍යාලයට ඇතුළත් කරගන්නා ලෙසට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලිපි මගින් දැනුම් දී තිබුණ ද ඉඩ පහසුකම් නොමැති වීම මත එම දියණියන් තිදෙනා ඇතුළත් කර ගැනීමට නොහැකි බව වඋත්තරකාර පාර්ශවය වන කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් දන්වා තිබියදී, ඉන්පසුව කථිකාචාර්යවරයෙකුගේ දියණියක එම ශ්‍රේණියටම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපියක් මත ඇතුළත් කර ගැනීම හරහා පැමිණිලිකාරියන් තිදෙනා වෙනස් කොට සැළකීමකට ලක්ව ඇති බව නිරීක්ෂණය වේ.

## <u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමේ දී පැමිණිලිකාරියන් තිදෙනා විසින් වගඋත්තරකාර පාර්ශවය වන කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති අංක ED/08/01/01/01/ST/Vol-II සහ 2022.12.02 දිනැති ලිපි ත්‍රිත්වය යොමු කර තිබියදී එම ලිපි සම්බන්ධයෙන් කිසිදු පිළිතුරක් ලබා නොදී පසුව පැමිණිලිකාරියන් විසින් වරින්වර විද්‍යාලයෙන් සිදු කරන ලද විමසීම් වලදී විදුහල්පතිනිය විසින් තවත් ලිපියක් අවශ්‍ය බවට ඔවුන් හට දන්වා ඇති බව අනාවරණය වී ඇත.

ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් නිකුත් කරන ලද අංක ED/09/Ads(SA)/07 සහ 2023.03.21 දිනැති හා සමාංක සහ 2023.03.24 දිනැති ලිපි ද්විත්වය පැමිණිලිකාරියන් විසින් වගඋත්තරකාර පාර්ශවය වෙත ලබාදී ඇත්තේ 4 ශ්‍රේණියට අදාළ අධ්‍යයන වර්ෂය අවසන් වීමට පෙර වුවත්, වගඋත්තරකාර පාර්ශවය විසින් අධ්‍යයන වර්ෂය අවසන් වූ පසුව පැමිණිලිකාරියන් තිදෙනාගේ දියණියන් ඇතුළත් කර ගැනීමට ඉඩ පහසුකම් නොමැති බවට දන්වා ඇති බව නිරීක්ෂණය වන බැවින් වගඋත්තරකාර පාර්ශවය විසින් සිතාමතාම කල්ගත කරමින් අදාළ ලිපි සඳහා පිළිතුරු ලබාදීම මගහැර ඇති බව ද නිරීක්ෂණය වී ඇත.

ඒ ආකාරයට ඇතුළත් කර ගැනීමට ඉඩ පහසුකම් නොමැති නම් ඒ බව මුල් අවස්ථාවේදීම නොදන්වා පැමිණිලිකාරියන් හට වෙනත් ලිපියක් රැගෙන එන ලෙසට වගඋත්තරකාර පාර්ශවය විසින් දැනුම්දීම තුළින් මෙන්ම පැමිණිලිකාරියන් තිදෙනා හට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ලිපි නිකුත් කරන ලද දිනයේදීම ලිපි ලැබූ තවත් නිලධාරීන් එකොළොස් දෙනෙකුගේ දියණියන් එකොළොස් දෙනෙකු කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ 2 වන ශ්‍රේණිය වෙත ඇතුළත් කරගෙන තිබීම තුළින් තම දියණියන් තිදෙනා ද කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය වෙත ඇතුළත් කරගත හැකි වනු ඇති බවට පැමිණිලිකාරියන් තුළ නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇති වීම යුක්ති සහගත බව ද නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකාරියන් තිදෙනාගේ දියණියන් ඇතුළත් කර ගැනීමට ඉඩ පහසුකම් නොමැති බවට දන්වා තිබියදී අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේම ලිපියක් මත වෙනත් දියණියක කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ එම ශ්‍රේණියටම වගඋත්තරකාර පාර්ශවය විසින් ඇතුළත් කර ගෙන ඇති බවට අනාවරණය වී ඇත.

මේ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුතුය යන අයිතිවාසිකම 1 වන, 2 වන සහ 3 වන පැමිණිලිකාරියන් සම්බන්ධයෙන් උල්ලංඝණය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

වගඋත්තරකාර පාර්ශවය විසින් 1 වන, 2 වන සහ 3 වන පැමිණිලිකරියන් තිදෙනාගේ දියණියන් වන පිළිවෙලින් යූ.එන්.ජේ.එම්. ජයරත්න, දිනාගි දියත්මා වල්පිටගමගේ සහ තෙසාරා සේමින්දි වික්‍රම විතාරණ යන තිදෙනා කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ 4 වන ශ්‍රේණියට ඇතුළත් කිරීම අනුමත කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කො/ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ විදුහල්පතිනිය වෙත යොමු කළ අංක ED/08/01/01/01 ST/Vol-II සහ 2022.12.02 දිනැති ලිපි ත්‍රිත්වය අනුව එකී දියණියන් තිදෙනා කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ මේ වන විට ඔවුන් අධ්‍යාපනය ලැබිය යුතුව ඇති සමාන්තර ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට කටයුතු කළ යුතු ය.

2024.09.27 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරියන් විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. } දැනගැනීම සඳහා

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. } සුදුසු පියවර ගැනීම සඳහා

03. අධ්‍යක්ෂ (ජාතික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. } සුදුසු පියවර ගැනීම සඳහා